ඇප බැඳුම්කරය (නිෂ්පාදන)

1985 අංක 21 දරණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනතින් සංස්ථාපනය කරන ලද ස්වකීය ලියාපදිංචි ගත කාර්යාලය බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත අංක 234 හි පිහිටි (මෙහි මින් මතු කාර්යාංශය යයි සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (කාර්යාංශය අනුප්‍රාප්තිකයන් හා අද්මිනිස්ත්‍රාස්කරුවන් ද ඇතුළත්ව) **පළමු වන පාර්ශවයට** ද,

සහ,

මෙම ඇප බැඳුම්කරයේ මතු පළමු සහ දෙවන ඇපකරුවන් ලෙස හඳුන්වනු ලබන පහත සඳහන් තැනැත්තන් සහ මින් මතු පොදුවේ එකී ඇපකරුවන් **දෙවන පාර්ශවය** ලෙස ද හඳුන්වන,

<u>පළමු ඇපකරු ලෙස</u>

............................................... [1] ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ............................................... [2] ප්‍රාදේශීය

ලේකම් කොට්ඨාශයේ ............................................................................................. ...............................

..............................................................[3] ලිපිනයෙහි පදිංචි (ජා.හැ.අං ................................................. [4] )

හිමි .................................................................. . ................................................................................ [5] ද,

<u>දෙවන ඇපකරු ලෙස</u>

............................................... [6] ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ............................................... [7] ප්‍රාදේශීය

ලේකම් කොට්ඨාශයේ ............................................................................................. ...............................

..............................................................[8] ලිපිනයෙහි පදිංචි (ජා.හැ.අං ................................................. [9] )

හිමි .................................................................. . ................................................................................ [10]

ද,

යන දෙවන පාර්ශවයේ උරුමකාර, පොල්ම:කාර සහ අද්මිනිස්ත්‍රාසිකාර, බලකාර හෝ ලැබුම්කාර ආදීන් අනෙක් පක්ෂයට ද බැඳී පහත සඳහන් පොරොන්දු ගිවිසිලි වලට එකගව ................................ [11] දින බත්තරමුල්ල හි දී ස්ව කැමැත්තෙන් ඇතුලත් වන්නට යෙදුන ඇප ගිවිසුමේ වගනම්,

1. මෙහි මින්මතු සේවා නියුක්තිකයා යැයි කියනු ලබන .............................................................
   .................................................................................................... [12] ලිපිනයෙහි පදිංචි
   ........................................................................................................ ........................................... [13]
   (ජා.හැ.අං ...................................... [14] ) යන අය දකුණු කොරියානු රාජ්‍යයේ
   ............................................................................. [15] ආයතනයෙහි මාස.............................. [16]
   කාලයක් සඳහා කම්කරු තනතුරෙහි (මින් මතු විදේශ රැකියාව ලෙස හඳුන්වනු ලබන) සේවකයෙකු

වශයෙන් සේවය කිරීමට ..................................... [17] දින ගිවිසගෙන සිටින බවත් පළමු පාර්ශවය මගින් එම රැකියාව ලබා ගෙන ඇති බවත් සේවා නියුක්තිකයා පළමු පාර්ශවය සමග ................................ [18] දින එම විදේශ රැකියාව ලබාගැනීම සඳහා බත්තරමුල්ලේ දී ගිවිසුමකට (මින් මතු රැකියා ගිවිසුම ලෙස හඳුන්වනු ලබන) එළඹ ඇති බවත් පාර්ශවයන් පිළිගනු ලබයි.

2. සේවා නියුක්තිකයා රැකියා ගිවිසුම අනුව කටයුතු කිරීමට බැඳී ඇති බැවින් සහ එකී රැකියා ගිවිසුමෙහි කාර්යය සාධනයෙහිලා මෙන්ම එකී රැකියා ගිවිසුම යථා පරිදි ඉටු කිරීමට සේවා නියුක්තිකයාට ඇති වගකීම තහවුරු කරනු පිණිස ඇපකරුවන් විමට ස්ව කැමැත්තෙන් දෙවන පාර්ශවය බන්ධදායකයන්ව ඇති බවට පාර්ශවයන් පිළිගනු ලබන බවට මෙම ඇප බැඳුම්කරය මගින් මෙසේ සාක්ෂි දරණ බව සියල්ලන් විසින්ම දැනගත යුතුය. මෙම ඇප බැඳුම්කරය සේවා නියුක්තිකයා විසින් සේවා ගිවිසුම දීර්ඝ කරගනු ලැබුවහොත් එසේ දීර්ඝ කරගනු ලබන අවසන් කාලය දක්වා වලංගු වන බවට දෙවන පාර්ශවය එකඟ වේ.

3. විදේශ රැකියා ගිවිසුමට අනුව අදාළ කාල සිමාව සම්පූර්ණ කිරීමෙන් පසු හෝ රැකියා ගිවිසුමේ නියමයන් අනුව සේවය අවසන් කිරීමෙන් පසු සේවා නියුක්තිකයා වහාම ශ්‍රී ලංකාවට පැමිණිය යුතු අතර එසේ පැමිණ සති දෙකක කාලයක් ඇතුළත මෙහි පළමු පාර්ශවය වෙත වාර්තා කළ යුතුය. සේවා නියුක්තිකයා විසින් විදේශ රැකියා ගිවිසුමට අනුව පමණක් ක්‍රියා කල යුතු අතර එකි විදේශ රැකියා ගිවිසුම කඩවන ආකාරයට කිසියම් වූ අවස්ථාවක ක්‍රියා නොකළ යුතුය.

4. සේවා නියුක්තිකයා වෙනුවෙන් ඇපකරුවන් විමට දෙවන පාර්ශවය එකඟ වී ඇති බැවින් සේවා නියුක්තිකයා විසින් එකි විදේශ රැකියා ගිවිසුම කඩවන ආකාරයට කිසියම් වූ අවස්ථාවක ක්‍රියා කර ඇත්නම් ශ්‍රී ලංකා රුපියල් මිලියන දෙකක (රු.2,000,000/-) මුදලක් පළමු පාර්ශවය ඉල්ලා සිටි විටකදී පළමු පාර්ශවය වෙත ඉල්ලා සිටි දිනට එකවර නොපමාව ගෙවීම පිණිස දෙවන පාර්ශවය බන්ධනය වි ඇති බවත් එම ගෙවීම උදෙසා ඇපකරුවන්ගේ උරුමකරුවන් අද්මිනිස්ත්‍රාත්කරුවන් සහ පොල්ම:ක්කරුවන් වෙනුවෙන්ද මෙම ලියවිල්ල මගින් එක්ව සහ වෙන් වෙන්ව බන්ධනය වි සිටිනු බවත් දෙපාර්ශවය පිළිගනු ලබයි.

5. සේවා නියුක්තිකයා විසින් එකි විදේශ රැකියා ගිවිසුම කඩවන ආකාරයට කිසියම් වූ අවස්ථාවක ක්‍රියා කර ඇත්නම් එකී ඇප මුදල වන රුපියල් මිලියන දෙකක (රු.2,000,000/-) මුදල ඇපකරුවන්ගෙන් එක්ව හෝ වෙන් වෙන්ව පළමු පාර්ශවයට අයකර ගැනීමට සම්පූර්ණ නෛතික හිමිකමක් හා බලයක් ඇති බැව් දෙපාර්ශවය පිලිගනී.

6. මෙම ඇප බැඳුම්කරය සම්බන්ධයෙන් නිසි අධිකරණ බලය කඩුවෙල දිසා අධිකරණය විය යුතු බව දෙපාර්ශවය විසින් පිළිගනු ලැබේ.

7. මෙම බැඳුම්කරයේ කාර්යයන් වෙනුවෙන් සියළුම දැනුම්දිම් සඳහා දෙවන පාර්ශවයේ ඉහත දක්වා ඇති ලිපිනයන් ස්ථිර ලිපිනය ලෙස පිළිගනු ලබන අතර එම ලිපිනයන්ට සිතාසි හා නොතිසි භාරදීම වලංගු හා නිසි භාරදිමක් බව දෙපාර්ශවය විසින් පිළිගනු ලබයි.

8. තවද ඇපකරුවන් විසින් පිළිවලින් අයකර ගැනීමේ වාසිය සහ බෙදා ගෙවිමේ වාසිය (beneficium ordinis seu exoussionis et divisionis) ද ඇප කරුවන්ගේ තත්වයෙන් නීතියෙන් ඇපකරුවන්ට හිමි වෙනත් සියළු වාසි, වරප්‍රසාද සහ ව්‍යතිරේකද මෙයින් අත්හැර දමන්නෙමු. ඒ අත්හැර දැමීමේ බලපෑම් සහ බලාත්මකභාවය අපට පැහැදිලි කරදෙන ලදි. එසේම ඒ කාරණය සම්බන්ධයෙන් අප පූර්ණ වශයෙන්ම දැනුවත්ව සිටින බවද අප මෙයින් ප්‍රකාශ කර සිටිමු.

9. රැකියා ගිවිසුම කිසිම අවස්ථාවකදී සේවා නියුක්තිකයා විසින් උල්ලංඝනය කල හොත්, රැකියා ගිවිසුමට අනුව එකඟ වූ රැකියා ස්ථානය අතහැර ගියහොත්, ශ්‍රී ලංකාවේ කිර්ති නාමයට බලවත් හානියක් සිදුවන බවටත් පළමු පාර්ශවයේ මහජන සේවා කටයුතු සඳහා බලවත් අගතියක් සිදු වන බවටත් ශ්‍රී ලංකාවේ රැකියා අපේක්ෂකයින්ට අනාගතයේ දී විදේශ රැකියාවන් ලබාගැනීමේ දී අහිතකර තත්වයක් උද්ගත විය හැකි බවටත් රැකියා ගිවිසුම පදනම් වූ රැකියාවේ වටිනාකම ශ්‍රී ලංකා රුපියල් මිලියන දෙකක (රු.2,000,000/-) මුදලක් වන බවටත් මනා අවබෝධයකින් යුතුව ස්ව කැමැත්තෙන් මෙහි ඇප කරුවන්ව ඇති බවට දෙවන පාර්ශවය විසින් මෙයින් වැඩිදුරටත් පිළිගනු ලබයි.

ඉහත පළමු පාර්ශවය සහ දෙවන පාර්ශවය ඉහත සියලු ප්‍රකාශයන්ට එකඟව වගකීම් මැනවින් අවබෝධ කරගත් බැවින් ඉහත සියලු ප්‍රකාශයන්ට නියමිත වගකීම් භාරගැනීම සඳහා බත්තරමුල්ලේ දී අත්සන් තබන ලදී.

<u>පළමු පාර්ශවය</u>

........................................................
නම :-

තනතුර :- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, (පුහුණු) / කළමනාකරු, බඳවාගැනීම් (කොරියානු) අංශය
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

(38.11.08 අංක දරණ අධ්‍යක්ෂක මණ්ඩල තීරණය ප්‍රකාරව 1985 අංක 21 දරණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 16(2) ඇ වගන්තිය ප්‍රකාරව බලය පැවරීම මත)

<u>දෙවන පාර්ශවය</u>

| | |
|---|---|
| ...................................... | .......................................... |
| **පළමු ඇපකරු (අත්සන)** | **දෙවන ඇපකරු (අත්සන)** |

<u>සාක්ෂි</u>

1. ………………………………………….………………........................… …...………
(නම, ජාතික හැඳුනුම්පත් අංකය) **(අත්සන)**

2. ……………………………………………..…………………...….........… …...............
(නම, ජාතික හැඳුනුම්පත් අංකය) **(අත්සන)**

මෙම ඇප බැඳුම්කරයේ අඩංගු කරුණු මා විසින් මෙහි සඳහන් සියලු පාර්ශවයන්ට කියවා පැහැදිලි කර දුන් පසු එම කරුණු තේරුම්ගෙන මා ඉදිරියේ දී මෙම ලියවිල්ලට හා මෙම ලියවිල්ලෙහි තවත් පිටපත් දෙකකට ඔවුනොවුන් විසින් වර්ෂ ............................ දින දී බත්තරමුල්ලේදී අත්සන් තබන ලද බවට මෙයින් සහතික කරමි.

**නීතීඥ**